# සීමා නිර්ණය කොමිෂන් සභාව

# எல்லை நிர்ணய ஆணைக்குழு

## DELIMITATION COMMISSION

කාර්තුමය ප්‍රගති වාර්තාව

**2017 – 2 වැනි කාර්තුව**

காலாண்டு செயலாற்றுகை அறிக்கைகள்

2017 - 2ம் காலாண்டு

**Quarterly Performance Report**

**2017 – 2nd Quarter**

## ශ්‍රී ලංකා සීමා නිර්ණය කොමිෂන් සභාව
## 2017 ද්විතිය කාර්තුවේ වාර්තාව
## ( 2017 අප්‍රේල් 1 සිට 30 දක්වා )

**හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූලව පිහිටුවන ලද සීමා නිර්ණය කොමිෂන් සභාව ආචාර්ය කේ. තවලිංගම් ගේ සභාපතිත්වයෙන් ද ආචාර්ය ඒ.ඩී බණ්ඩාරනායක හා මහචාර්ය එස් . එච් හස්බුල්ලා ගේ සාමාජිකත්වයෙන්ද යුතුව 2015 නොවැම්බර් 13 දින සිට ක්‍රියාත්මක වෙමින් පවතී.

සීමා නිර්ණය කොමිෂන් සභාව සිය කාර්යාලය ස්ථාපිත කොට එහි මනා ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කොට ගත්තාය. "සදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරිමෙහි, විශිෂ්ඨත්වය ලබා ගැනිම" කොමිෂන් සභාවේ දැක්ම වශයෙන්ද "ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස, සදාචාරාත්මක ලෙස, කාර්යක්ෂමව, පාරදෘෂ්‍ය භාවයෙන් යුතුව විශ්වාසනිය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරිම එහි මෙහෙවර වශයෙන්ද පිළිගෙන තිබේ. තවද කොමිෂන් සභාව එහි මෙහෙවර "නීතියට අනුකූලව ස්වාධීන, ආචාරශීලි, සාධාරණ, කාර්යක්ෂම, පාරදෘශ්‍ය හා විශ්වාසනිය ලෙස සාක්ෂාත් කර ගැනිමෙහි ලා" උත්සුක වන්නීය.

තවද මෙ රට ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ඵලදායි ලෙස සුරක්ෂිත කිරිමේ හා එම පරිසරය සුරකෂිත කිරිමේ අධ්‍යාශයෙන් යුතුව, **අ)** දේශපාලන නියෝජනය, පුරවැසියන්ට පරිපාලනමය සහ / හෝ සමාජ-ආර්ථික සේවාවන් වන අධ්‍යාපනය, සෞඛ්‍යය හෝ ආරක්ෂාව සැලැස්වීම සඳහා නියමිත කාල වකවානුවන් තුළ භූගෝලීය සීමා මායිම් ලකුණු කරදිම, **ආ)** ආණ්ඩුවටත් වෙනත් ආයතන වලටත් සිය තීරණ ගැනිම පහසුකර විම සඳහා සීමා නිර්ණය පිළිබඳ දැනුම හා අවශ්‍ය දත්ත සපයාදිම, **ඇ)** සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා ඊට අනුපාතික වු වෙනත් කාරණා පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයක් බිහි කිරිම යන ඉලක්කයන් සපුරා ගැනිමට කොමිෂන් සභාව ක්‍රියා කරන්නීය.

කොමිෂන් සභාව සිය සීමා නිර්ණය කාර්යභාරය ආරම්භ කිරිම සඳහා අවශ්‍ය අධිකාරය ලැබෙන තුරු මහත් අපේක්ෂාවෙන් බලා සිටින්නීය.

### 2017 දෙවන කාර්තුවේ වාර්තාව

2017 අප්‍රේල් 1 සිට ජුනි 30 දක්වා වූ මෙම ත්‍රෛමාසික වාර්තාවෙහි කොමිෂන් සභාව ගත් තිරණ හා ඉටු කරන ලද කාර්යයන් දැක්වේ. එම කාලච්ඡේදය තුළ කොමිෂන් සභාව රැස්වීම් 2 ක් පවත්වන ලද අතර වැදගත් කාර්යයන් කිහිපයක්ම ඉටු කර ඇත.

**සීමා නිර්ණය කොමිෂන් සභාව රැස්වීම්**

දෙවන කාර්තුව තුළ රැස්වීම දෙකක් පැවැත්විණ.

1. 2017 -04-05 දින 19 වැනි රැස්වීම
2. 2017-06-28 දින 20 වැනි රැස්වීම

**වෙනත් රැස්වීම**

1. **2017.05.07 දින අතිගරු ජනාධිපතිතුමා සමග පැවති රැස්වීම:** සියලුම ස්වාධීන කොමිෂන් සභා වල ප්‍රගතිය, ගැටලු හා අනාගත සැලසුම් සාකච්ඡා කිරීමට අතිගරු ජනාධිපතිතුමා ඒවාහි සභාපතිවරුන් හා ලේකම්වරුන් කැඳවිය. ඒ ඒ කොමිෂන් සභාවල ප්‍රගතිය හා ගැටලු පිළිබඳ ව සියලුම කොමිෂන් සභා සභාපතිවරු අතිගරු ජනාධිපතිතුමා ඉදිරියේ කරුණු ඉදිරිපත් කළහ.

2. **2017.05.29 දින ජනාධිපති ලේකම් සමග පැවති රැස්වීම :** 2017.05.17 දින අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවති රැස්වීම ට අනතුරුව ජනාධිපති ලේකම් එම රැස්වීමේ සාකච්ඡා වූ කරුණු පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා 2017.05.29 දින ස්වාධීන කොමිෂන් සභාවල ලේකම්වරුන් කැඳවිය. මෙම රැස්වීමේදී සීමා නිර්ණය කොමිෂන් සභා පනතක් සඳහා කෙටුම්පත් යෝජනාවක් සකස් කරන ලෙස සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම්ට උපදෙස් දුන්නේය.

3. **2017.05.30 දින ගරු කථානායකවරයා සමග පැවති රැස්වීම:** සියලුම ස්වාධීන කොමිෂන් සභාවල ප්‍රගතිය හා ගැටලු පිළිබඳව ගරු කථානායකවරයා කොමිෂන් සභා සභාපතිවරුන් හා ලේකම්වරුන් සමග සාකච්ඡා කළේය. ජනාධිපති ලේකම් උපදෙස් දුන් පරිදි සීමා නිර්ණය කොමිෂන් සභා පනතක් සඳහා කෙටුම්පතක් නුදුරු අනාගතයේ ඉදිරිපත් කිරීමට සීමා නිර්ණය කොමිසම පියවර ගන්නා බව සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා මෙම රැස්වීමේදී පැහැදිලි කළේය. ස්වාධින කොමිෂන් සභා වලට අවශ්‍ය ගොඩනැගිලි සංකීර්ණයක් සම්බන්ධයෙන් කළ සාකච්ඡාවේදි සීමා නිර්ණය කොමිෂන් සභාවේ අනාගත පුලුල් කාර්ය භාරයට සරිලන සේ අවශ්‍ය ඉඩ පහසුකම් ප්‍රමාණයක් ඉල්ලා සිටින ලෙස උපදෙස් දුන්නේය.

**පරිපාලන කටයුතු**

1. **නිල හැඳුනුම්පත්:** සභාපතිවරයාට ද කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ද කාර්ය මණ්ඩලයට ද නිල හැඳුනුම්පත් නිකුත් කරන ලදි.
2. **පරිපාලන නිලධාරි :**2017.06.01 දින එච්.ඩී ජයසිරි මහතා රාජකාරි සඳහා වාර්තා කළේය.
3. **සීමා නිර්ණය කොමිෂන් සභාවෙන් බැහැරවී යන ලේකම්වරයා ගේ සේවය අගය කිරීමේ ලිපිය:** ඔහුගෙන් සීමා නිර්ණය කොමිසම ට ඉටු වූ අගනා සේවය අගය කරමින් ලිපියක් 2017 මැයි මස මැද භාගයේදි යවන ලදි.

**ඉටු කරන ලද කටයුතු**

1. **2016 වාර්ෂික කාර්ය සාධන වාර්තාව:** 2016 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධනය පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් සකස් කොට පාර්ලිමේන්තුවට හා ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කරන ලදි. මෙහිදී සීමා නිර්ණය කොමිසම සතු බලතල හා කාර්ය භාරය හා පත්කිරීම් වලට අදාළව පවත්නා ව්‍යවස්ථා ප්‍රතිපාදන, සීමා නිර්ණය කොමිසමට කාර්ය මණ්ඩලයක් පත් කිරීම, සීමා නිර්ණය කොමිෂන් සභාවේ මුල්‍ය කටයුතු හා පිරිවැය ඇතුළත් ත්‍රෛමාසික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම, 2016 වර්ෂය තුළ සීමා නිර්ණය කොමිෂන් සභාව ගෙන ඇති වැදගත් පියවරයන් යන කරුණු වලට අදාළ ගැටලු හා සීමා නිර්ණය කොමිෂන් සභාවට අදාළ වෙනත් කාරණා වාර්ෂික වාර්තාවේ අන්තර්ගත විය.

2. **මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශිය සභාවලින් පළාත් පාලන ආයතන සංස්ථාපනය පිළිබඳ වූ ගැසට් නිවේදන එක් රැස්කිරීම:** තම ආයතනය සංස්ථාපනයට අදාල ගැසට් නිවේදන

ඉදිරිපත් කරන ලෙස ප්‍රථම කාර්තුවේදී සියලුම පළාත් පාලන ආයතන වලට ලිපි යවන ලදි. ජූනි අග වන විට ලැබුණු අති මහත් ප්‍රතිචාරය 1 වගුවේ ඇතුළත් කෙරේ.

| 1 වගුව: 2017 ජූනි මස අග වන විට ලැබුණු ගැසට් නිවේදන | | | | |
|---|---|---|---|---|
| | මහ නගර සභා | නගර සභා | ප්‍රාදේශිය සභා | එකතුව |
| පළාත් පාලන ආයතන ගණන | 22 | 42 | 272 | 336 |
| ලැබුණු ගැසට් නිවේදන සංඛ්‍යාව ( සිංහල) | 22 | 42 | 272 | 336 |

**3. ප්‍රාදේශිය ලේකම් කාර්යාල පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදන එකතු කිරිම:**

තම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය පිහිටුවීම සිදු කරන ලද ගැසට් නිවේදනයේ පිටපත් එවන ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට දන්වා යවන ලදි. ලැබුණු ප්‍රතිචාරය දිරිගන්වන සුළු විය. කෙසේ වුවත් එය නැවත මතක් කිරිමට සීමා නිර්ණය කොමිසමට සිදුවිය. ජූනි අග වන විට මෙහි ප්‍රගතිය 2 වගුවේ සඳහන් වේ.

| 2 වගුව : 2017 ජූනි අග වන විට ලැබුණු ගැසට් නිවේදන | |
|---|---|
| | එකතුව |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ගණන | 331 |
| ලැබුණු ගැසට් නිවේදන සංඛ්‍යාව ( සිංහල ) | 127 |

**අනාගතය සඳහා සැලසුම් කර ඇති කටයුතු:**

කාර්තුවේ අවසන් රැස්වීමේදී සැලසුම් කරන ලද සාකච්ඡාවට භාජනය කරන ලද අනාගත ක්‍රියාකාරකම් දෙකකි. ඒවා පහත සඳහන් පරිදි වේ.

1. **ප්‍රතිපත්ති කෙටුම්පත:** යෝජිත සීමා නිර්ණය කොමිෂන් සභා පනත සඳහා අවශ්‍ය වන්නා වූ කෙටුම්පත් ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදි. මෙහි ලා ප්‍රතිපත්ති ප්‍රකාශයේ අන්තර්ගතය හා එය සකස් කිරිමේහි දී ගත යුතු ක්‍රියා මාර්ගය සීමා නිර්ණය කොමිෂන් සභාව සාකච්ඡා කළාය.
2. **ක්‍රියාකාරි සැලැස්ම:** මෙම කාර්තුවේදී ක්‍රියාකාරි සැලැස්ම සකස් කොට නිම කරන ලදි. ( ඇමුණුම බලන්න)